# ශ්‍රී ලංකාව තුළ තාක්ෂණය සමඟ බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පිළිබඳව CEDAW කමිටුවේ අවසන් නිරීක්ෂණ සම්බන්ධයෙන් වන පසු විපරම



සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින්, 2025 පෙබරවාරි මාසයේදී පැවැත්වුණු CEDAW කමිටුවේ 09 වන ආවර්තිතා සමාලෝචනය සඳහා ශ්‍රී ලංකාව තුළ තාක්ෂණය ඔස්සේ පහසුකරණය කෙරෙන ලිංගිකත්වය සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පිළිබඳ විකල්ප වාර්තාවක් (shadow report) එම කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

2022 වසරේ දී ඉදිරිපත් කරන ලද රාජ්‍ය වාර්තාවේ ශ්‍රී  ලංකාව තුළ තාක්ෂණය සමඟ බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හෝ තාක්ෂණය ඔස්සේ සිදු කෙරෙන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වර්ධනය වෙමින් පවතින ගැටලුකාරී බව පිළිබඳව නිශ්චිත සඳහනක් නොතිබුණද, ශ්‍රී ලංකාව පිළිබඳ CEDAW සමාලෝචනයට සහභාගී වූ දූත පිරිසේ ප්‍රධානියා මෙන්ම කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය  ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මියගේ සමාරම්භක ප්‍රකාශයට පහත කරුණු ඇතුළත් විය:

> "තාක්ෂණය සමඟ බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) යනු ශ්‍රී  ලංකාව දැනට මුහුණ දෙමින් සිටින තවත් බරපතල අභියෝගයකි. ඩිජිටල් වේදිකාවල ව්‍යාප්තිය ත් සමඟ, කාන්තාවන් සහ අවදානම් සහගත තත්ත්වයන්ට මුහුණ දෙන පුද්ගල කණ්ඩායම් හිරිහැරයන්ට, අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන හිංසනයට සහ  අන්තර්ජාලය හරහා එල්ල වන තර්ජන සහ සූරාකෑම්වලට වැඩි වැඩියෙන් ගොදුරු වෙමින් සිටියි. සාම්ප්‍රදායික නීතිමය රාමු තුළ මෙවන් ප්‍රචණ්ඩත්වයන් සැලකිල්ලට නොගැනෙන බැවින් හෝ ඒවා පිළිබඳව අවධානය යොමු නොකිරීම හේතුවෙන් ඒවා විශේෂයෙන් හානිකර බවක් උසුලයි. එවැනි හානිවලින් පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වඩාත් ශක්තිමත් නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක  කිරීමට රජය කටයුතු කරමින් සිටියි. පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම්, අන්තර්ජාලය ඔස්සේ අන් අයට කරදරකාරී අයුරින් ඔවුන් පිළිබඳව සෙවිල්ලෙන් සිටීම (online stalking) සහ වෛරී ප්‍රකාශ වලට අදාළ ගැටලු විසඳීම මෙයට ඇතුළත් වන අතර, මේ සියල්ල කාන්තාවන්ට සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට වැඩි අවාසිදායක බවකින් යුතුව බලපාන ගැටලු වේ. තාක්ෂණයේ සීඝ්‍ර දියුණුවත් සමඟම වඩ වඩාත් අභියෝගාත්මක වෙමින් අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන මිනිස් ජාවාරම සහ මාර්ගගත ලිංගික ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ සයිබර් අපරාධ පිළිබඳ සම්මුතිය අරමුණු කරගත් සාකච්ඡා සඳහා ශ්‍රී  ලංකාව ක්‍රියාකාරීව සහභාගී වී තිබේ. කාන්තාවන්ට එරෙහිව මාර්ගගතව සිදුවන සහ තාක්ෂණය සමඟ බැඳි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලබන සයිබර් අපරාධ පිළිබඳ බුඩාපෙස්ට් සම්මුතියේ පාර්ශ්වකරුවෙකු ලෙස ද ශ්‍රී ලංකාව කටයුතු කරයි. ඩිජිටල් තාක්ෂණය සහ මාර්ගගත වේදිකා භාවිතයෙන් සිදු කෙරෙන අපරාධවල භයානක වර්ධනය හේතුවෙන් පුද්ගලයන්ගේ සහ සමාජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන පියවර ශක්තිමත් කිරීම අවශ්‍ය වී තිබේ. 2024 මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (Online Safety Act) මගින් අරමුණු කරනුයේ, වඩ වඩාත් මහජන වැදගත්කමක් උසුලන මෙම ගැටලුවට විසඳුම් සෙවීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සමාජයේ අවදානමට ලක්විය හැකි පුද්ගල කණ්ඩායම් ආරක්ෂා කිරීමයි."

එම සමාලෝචනයේදී, කමිටු සාමාජිකයින් කිහිපදෙනෙකු විසින් රජය පාර්ශ්වයෙන් කරුණු විමසා සිටි අතර, 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (Online Safety Act) යනු කාන්තාවන් සහ ගැහැණු ළමුන් අන්තර්ජාලය හරහා සිදුවන හානීන්ගෙන් ආරක්ෂා කිරීම සහ වැරදිකරුවන් සහ (ඩිජිටල්) වේදිකා වගවීමට ලක් කිරීම සඳහා පවතින වඩාත්ම සුදුසු පනත වන්නේද යන්න සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) මැඩපැවැත්වීම සඳහා සේවා සපයන්නන් සහ අධිකරණ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් පුහුණු කිරීමට ගෙන ඇති පියවර මොනවාද යන්න ඒ අතර විය. මෙහි දී රජය පාර්ශ්වයේ ප්‍රතිචාර දැඩි ලෙස පදනම් වූයේ TFSGBV වලින් සාමාන්‍ය මහජනතාව ආරක්ෂා කිරීම සඳහා වූ ප්‍රමාණවත් පියවරක් ලෙස, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම යන්න මත ය. මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා සයිබර් අපරාධ විමර්ශන ඒකකයක්, ප්‍රාදේශීය ඒකක සහ කාන්තාවන් හා ළමුන් සඳහා වන විශේෂිත ඒකක ඇතුළු නව යාන්ත්‍රණ ස්ථාපිත කර ඇති බව ද ඔවුහු ප්‍රකාශ කළහ.

**2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යනු ඉහළ මතභේදයට තුඩු දුන් නීතිමය පියවරකි; ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සහ රජයේ දූෂණ මෙන්ම අසාර්ථකත්වයන්ට එරෙහිව විරෝධය පළ කළ ඓතිහාසික සමාජ ව්‍යාපාරයක් වූ 'අරගලය' යන සිදුවීම්වලින් අනතුරුව මෙම පනත බලාත්මක කරන ලදී. මාර්ගගතව සිදුවන හිංසනයන්, වෙනත් අයෙකු ලෙස පෙනී සිටිමින් අනන්‍යතාවය වසන් කිරීම (impersonation) සහ අනුමැතියකින් තොරව යමෙකුගේ පුද්ගලික හා සමීප ස්වභාවයේ ඡායාරූප බෙදාහැරීම වැනි ක්‍රියාවන්ගෙන් කාන්තාවන් සහ දරුවන් ආරක්ෂා කරගැනීම සඳහා අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස රජය විසින් මෙම පනත ප්‍රවර්ධනය කළද, එහි ප්‍රායෝගික ක්‍රියාත්මක වීම මගින් පෙන්නුම් කරන්නේ ඊට හාත්පසින්ම වෙනස් තත්වයකි. මානව හිමිකම් සංවිධාන සහ ඩිජිටල් හිමිකම් සුරැකීමේ පාර්ශ්වකරුවන් විසින් පෙන්වා දෙන්නේ, තාක්ෂණය සමඟ බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ගොදුරු වූවන් ආරක්ෂා කිරීමට වඩා, මෙම නීතියේ පවතින පුළුල් සහ නොපැහැදිලි ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් දේශපාලන විරුද්ධවාදීන්, මාධ්‍යවේදීන් සහ ක්‍රියාකාරීන් ඉලක්ක කරගැනීම සඳහා ආයුධයක් ලෙස භාවිත කර ඇති බවයි. වඩාත් සුරක්ෂිත අන්තර්ජාල පරිසරයක් ගොඩනැගීම වෙනුවට, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මගින් පවතින භයානක වාතාවරණය තවදුරටත් දැඩි කර ඇති අතර, අන්තර්ජාලය හරහා සංවිධානය වන හිංසාකාරී පුද්ගල කණ්ඩායම් (online mobs) කෙරෙහි ඇති බිය සහ රජය විසින් නීතිමය චෝදනාවලට ලක් කිරීම කෙරෙහි ඇති බිය යන ද්විත්වයම හේතුවෙන් කාන්තාවන්, සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, ක්වියර් (LGBTQ+) පුද්ගලයින් සහ මානව හිමිකම් ආරක්ෂකයින් තව තවත් ස්වයං-වාරණයකට (self-censorship) ලක් වීම මෙමගින් සිදු වී ඇත. 2025 වසරේදී, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ (අහෝසි කිරීමේ) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණ. 2026 ජූනි මාසයේදී පැවැත්වූ දෙවන වර කියවීමේදී කිසිදු විවාදයකින් තොරව මෙම පනත් කෙටුම්පත අනුමත වූ නමුත්, එම පනත් කෙටුම්පතෙහි ඉදිරි කටයුතු සම්බන්ධයෙන් වෙනත් කිසිදු සැලසුමක් පාර්ලිමේන්තුව තුළ එතැන් සිට ප්‍රකාශයට පත් කර නොමැත.**

CEDAW කමිටුව සිය අවසන් නිරීක්ෂණවලදී පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කරන ලදී.

**28) f. අන්තර්ජාලය හරහා සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ඊට ප්‍රමාණවත් දඬුවම් ලබා දීම සඳහා වන පියවරයන් ශක්තිමත් කිරීම, සහ මාර්ගගත වේදිකා සපයන්නන් (providers of online platforms) සහ මාර්ගගත අන්තර්ගතයන් බෙදාහරින්නන් (distributors of online content) විසින් තමන්ගේ වේදිකාවන් තුළ පවතින අපරාධමය අන්තර්ගතයන් වාර්තා කිරීමට, ඉවත් කිරීමට හෝ අවහිර කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් ඔවුන් වගවීමට ලක් කිරීම තහවුරු කිරීම.**

මෙම නිර්දේශයෙන් අනතුරුව, අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබාගැනීම සහ මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා වන ඉදිරි ක්‍රියාමාර්ග හඳුනාගැනීම වෙනුවෙන්, සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින් 2026 මැයි 26 වන දින කොළඹ දී බහු-පාර්ශ්වකරුවන්ගේ සංවාදයක් පවත්වන ලදී.

මෙම සාකච්ඡාව සඳහා ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ සහ විමර්ශන කාර්යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, 1938 ජාතික කාන්තා උපකාරක දුරකථන සේවයේ කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීති ආධාර කොමිෂන් සභාව, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය යනාදී ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ශ්‍රී ලංකාව තුළ තාක්ෂණය සමඟ බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පිටුදැකීම වෙනුවෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන් සහභාගී වූහ.

එම සාකච්ඡාවෙන් පහත සඳහන් ක්‍රියාකාරී පියවරයන් සහ නිර්දේශයන් මතු කෙරිණි:

1. තාක්ෂණය සමග බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පිළිබඳ තනි, කේන්ද්‍රීය සහ පුළුල් පනතක් බලාත්මක කිරීම. පවතින නීතිමය රාමුව තුළ ඊට අදාළ විධිවිධාන සහ ආරක්ෂණ පියවර කිහිපයක් අන්තර්ගත වුවද, ශ්‍රී ලංකා නීතිය තුළ දැනට TFSGBV සඳහා නීතිමය අර්ථ දැක්වීමක් නොමැත.

2. තාක්ෂණික සාක්ෂරතාව නොමැතිකම මාර්ගගත ක්‍රම හරහා සිදුවන සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට (Online Gender-Based Violence) ප්‍රධාන හේතුවක් වන බැවින්, සියලුම අංශ තුළ ඩිජිටල් සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව උත්සාහයන් ගැනීම.

3. රජය විසින් ක්‍රියාත්මක කෙරෙන සියලුම පුහුණු වැඩසටහන් සඳහා නව ඩිජිටල් ප්‍රවණතා සහ මතුවෙමින් පවතින තර්ජන පිළිබඳ දැනුම ඇතුළත් කිරීම.

4. විශාල පරිමාණයේ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සැම විටම ප්‍රායෝගික නොවිය හැකි බැවින්, ප්‍රජාව පදනම් කරගත් කුඩා පරිමාණයේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. පුද්ගල මට්ටමේ ඩිජිටල් දැනුවත්භාවය සහ වගකීම් සහගත අන්තර්ජාල හැසිරීම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ක්ෂණික ප්‍රයත්නයන් දියත් කිරීම.

5. ඉඳහිට ක්‍රියාත්මක කෙරෙන දැනුවත් කිරීමේ වැඩසටහන් මත පමණක් පදනම් නොවී, ඩිජිටල් සාක්ෂරතාව සහ බහුවිධ සාධක සැලකිල්ලට ගන්නා ප්‍රවේශයක් (intersectional approach) ජාතික පාසල් විෂය මාලාවට ඒකාබද්ධ කිරීම.

6. තාක්ෂණය සමග බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයෙන්, නීතිපති දෙපාර්තමේන්තුව සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ද ඇතුළුව විවිධ පාර්ශ්වයන් අතර නිරන්තර සංවාද පැවැත්වීම; එමගින් මෙවැනි ප්‍රචණ්ඩත්වයන්ගේ වින්දිතභාවයෙන් දිවි ගලවා ගත් තැනැත්තන් මුහුණ දෙන යථාර්ථයන් පිළිබඳව මෙම නිලධාරීන්ගේ අවබෝධය වැඩිදියුණු කළ හැකිය.

7. පොලිසිය සහ දුරකථන උපකාරක සේවා සපයන්නන් ඇතුළු රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීම; විශේෂයෙන්ම කාන්තා නිලධාරීන් රාත්‍රී වැඩමුරවල සේවය කරන සහ පැමිණිලි සඳහා ප්‍රතිචාර දක්වන ස්ථාන පිළිබඳ සැලකිල්ලක් දැක්වීම.

8. දැනට පොලිස් ස්ථානවල කාන්තා හා ළමා කාර්යාංශ සඳහා අනුයුක්ත කර ඇති කාන්තා නිලධාරීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින්, පොලිස් බලකාය තුළ සිටින කාන්තා නිලධාරීන් සංඛ්‍යාව ඉහළ නැංවීම.

9. තාක්ෂණය වගකීම් සහගත ලෙස භාවිත කිරීම, පෝස්ට් පළ කිරීම (sharing posts), අන්තර්ජාලයේ ඇති තොරතුරු වල සත්‍යතාව තහවුරු කිරීම සහ කෘතිම බුද්ධිය (AI) සදාචාරාත්මකව භාවිත කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම ඇතුළුව, අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයක් හරහා ඩිජිටල් ක්ෂේත්‍රයේ යහපත් භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.

10. වෘත්තීයමය හා සදාචාරාත්මක මාධ්‍ය වාර්තාකරණය ප්‍රවර්ධනය කිරීම මගින් ආයතනික සහ පන්තිමය පක්ෂග්‍රාහීත්වයන් ආමන්ත්‍රණය කිරීම.

11. විශේෂයෙන්ම විද්‍යුත් සාක්ෂි හැසිරවීම, දුරකථන සංවාද නීත්‍යානුකූලව පටිගත කිරීම සහ එවැනි සාක්ෂි භාවිත කිරීමේ නීතිමය පටිපාටීන් පිළිබඳව වන නීතිමය දැනුවත්භාවය ඉහළ නැංවීම. මෙම දැනුවත්භාවය රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් අතර ශක්තිමත් කළ යුතුව ඇත.

12. අදාළ අවස්ථාවන්හිදී වින්දිතයින්ගේ පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය සුරක්ෂිත කරමින්, ඔවුන්ට නිර්නාමික ලෙස පැමිණිලි ඉදිරිපත් කිරීමට ඉඩ සලසන විශේෂ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.

13. පවතින අධිකරණ පද්ධතිය දැනටමත් නඩු ගොඩගැසීම හේතුවෙන් දැඩි පීඩනයකට මුහුණ දෙමින් සිටින බැවින්, තාක්ෂණය සමඟ බැඳි ලිංගික හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධ නඩු විභාග කිරීම සඳහා විශේෂිත අධිකරණ පිහිටුවීම පිළිබඳව සලකා බැලීම. එවැනි නඩු විභාග කරන විනිසුරුවරුන් හට TFSGBV පිළිබඳ විශේෂිත පුහුණුවක් ද ලබා දීමද සිදු කළ යුතු වේ.

14. අධිකරණය සහ විදුලි සංදේශ සමාගම් විසින් මින් පෙර සාර්ථකව අනුගමනය කරන ලද සහයෝගිතා ප්‍රවේශයන් පදනම් කරගනිමින්, තාක්ෂණය සම්බන්ධ නීතිමය ගැටලු සඳහා ප්‍රායෝගික සහ සම්බන්ධීකරණයෙන් යුත් බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් ගොඩනැගීම. නව නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම දැනට පවතින නීති සමඟ අනුකූල වන බවටත්, නීති අතර අනුපිටපත් වීම්, නොගැලපීම් හෝ පරස්පරතාවයන් ඇති නොවන බවටත් ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් තහවුරු කළ යුතුය

15. නීතිමය අනුකූලතාව පවත්වා ගනිමින් සහ සියලු පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අධිකරණය, අදාළ නියාමන බලධාරීන් සහ විදුලි සංදේශ සේවා සපයන්නන් සම්බන්ධ කරගත් සම්බන්ධීකරණ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම.

16. පොලිස් ස්ථාන, සේවා ආයතන සහ පාසල් සඳහා සුදුසුකම් ලත් සහ නිසි පුහුණුව ලත් මනෝ උපදේශකවරුන් පත් කිරීම. වර්තමානයේ පාසල් විනය භාර ගුරුවරුන් බොහෝ විට මනෝ උපදේශක වරුන් ලෙස කටයුතු කරන අතර, පාසල් දරුවන් උපදේශන සහාය ලබා ගැනීමට යොමු වීම එමගින් අධෛර්යයමත් වේ.

17. TFSGBV මගින් පීඩාවට පත්වූවන් ඇතුළුව, ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි (SGBV) වින්දිතයින් සඳහා සුරක්ෂිත මධ්‍යස්ථාන/ආරක්ෂිත නිවස්න සංඛ්‍යාව සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඉහළ නැංවීමට රජය මැදිහත් විය යුතු වේ.

18. වින්දිතයන් හට සේවා සපයන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ අදාළ රාජ්‍ය ආයතන වෙත ප්‍රමාණවත් අයවැය සම්පත් වෙන් කිරීම මගින් එම සේවාවන්හි දීර්ඝකාලීන බව/තිරසාරභාවය තහවුරු කිරීම.

19. වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය ඇගයීම සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගවීම ශක්තිමත් කිරීම සඳහා මානව හිමිකම් සහ සමාජභාවය පිළිබඳ විගණන ශ්‍රී ලංකාව තුළ නිරන්තරයෙන් සිදු කිරීම.

20. ජාතික කාන්තා කොමිසම, ජාතික මට්ටමේ නායකත්වයක් ලබාදීමට හැකි සහ අදාළ සියලුම පාර්ශ්වකරුවන් නිල වශයෙන් කැඳවීමට හැකියාව ඇති ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම මගින් එය ශක්තිමත් කිරීම.

21. 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම. රජය විසින් පවත්වාගෙන යනු ලබන වින්දිතයින් සඳහා වන සුරක්ෂිත මධ්‍යස්ථාන/ආරක්ෂිත නිවස්න පිහිටුවීම සඳහා තාක්ෂණික වශයෙන් නීතිමය බලතල සහ

Centre for Equality and Justice

www.cejsrilanka.org | srilanka.cej@gmail.com

/CEJ.SL /cej_srilanka /CEJ_SriLanka /@CEJSriLanka

ජූලි 2026